# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/09 – 2023 මාර්තු 13 වැනි සඳුදා – 2023.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/208.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2020.12.30 දිනැති හා අංක 2208/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කටුගස්තොට, පල්ලේතලවින්න, වලව්වත්ත, අංක 12 හි කේ. එම්. ජී. කුලසේකර මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 01 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය

කේ. එම්. ජී. කුලසේකර,
අංක 12, වලව්වත්ත,
පල්ලේතලවින්න,
කටුගස්තොට.

පළමුවැනි පාර්ශ්වය

එදිරිව

නඩු අංකය: A/73/2020
IR/COM/04/2019/208

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
200, කිරුළ පාර,
කොළඹ 05.

දෙවන පාර්ශ්වය

බේරුම්කරු හිමාලි කුලරත්න

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මහනුවර දකුණු ඩිපෝවේ සේවය කරන ඇති කේ. එම්. ගාමිණී කුලසේකර මහතාට 2004 ජනවාරි මස සිට 2004 අප්‍රේල් මස දක්වා ගෙවූ වැටුප් වර්ධක 2004 මැයි මස සිට 2016 දෙසම්බර් මස දක්වා නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද ? යන්න පිළිබඳව වේ.

මෙම ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් වූ කරුණු සහ දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු සියලු කරුණු සලකා බලා මෙම ඉල්ලුම්කරු ඉල්ලා ඇති කරුණට අදළ දීමනාව ඔහුට ලබාදීමට සුදුසු බව තීරණය කරනු ලබන අතර තවදුරටත්, මෙම ඉල්ලුම්කරුගේ සේවා කාලය ගණනය කිරීම පහත පරිදි සිදු කරනු ලැබුණි.

සේවා කාලය ගණනය කිරීම -
ඔහු පත්වීම ලැබූ දිනය - 1982.10.18
ඔහු විශ්‍රාම ගත් දිනය - 2017.03.20
සේවා කාලය - වසර 34 මාස 5 දින 2

වර්ධක සඳහා හිඟ මුදල හා හිඟ පොළී මුදල ගණනය කිරීම

| සිට | දක්වා | වර්ධකය | හිමි වර්ධක ගණන | මුදල | පොලිය 10/25/30 |
|---|---|---|---|---|---|
| 2004/5 | 2004/12 | 40 x 5 | 200 x 7 | 1,000.00 | |
| 2005/1 | 2005/12 | 40 x 5 | 200 x 7 | 2,400.00 | |
| 2006/1 | 2006/12 | 40 x 5 | 200 x 7 | 2,400.00 | |
| 2007/1 | 2007/12 | 40 x 5 | 200 x 7 | 2,400.00 | |
| 2008/1 | 2008/12 | 75 x 5 | 375 x 12 | 4,500.00 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2009/1 | 2009/12 | 110 x 5 | 550 x 12 | 6,600.00 | 660.00 |
| 2010/1 | 2010/12 | 110 x 5 | 550 x 12 | 6,600.00 | 660.00 |
| 2011/1 | 2011/12 | 110 x 5 | 550 x 12 | 6,600.00 | 1,650.00 |
| 2012/1 | 2012/12 | 110 x 5 | 550 x 12 | 6,600.00 | 1,650.00 |
| 2013/1 | 2013/12 | 110 x 5 | 550 x 12 | 6,600.00 | 1,650.00 |
| 2014/1 | 2014/12 | 170 x 5 | 850 x 12 | 10,200.00 | 2,550.00 |
| 2015/1 | 2015/12 | 170 x 5 | 850 x 12 | 10,200.00 | 3,060.00 |
| 2016/1 | 2016/12 | 170 x 5 | 850 x 12 | 10,200.00 | 3,060.00 |
| | | | | 76,300.00 | 14,940.00 |

ඒ අනුව ඉල්ලුම්කරුට අදාල ගෙවීම ගණනය කිරීම පහත පරිදි සිදුවිය යුතු බවට තීරණය කරමි.

එකී වර්ෂ 34 සඳහා හිඟ පාරිතෝෂික මුදල- රු 850 x 34 (වසර) - රු. 28,900.00
එකී වර්ධක සඳහා හිඟ මුදල - රු. 76,300.00
හිඟ පොලී මුදල - රු. 14,940.00

ඒ අනුව ලැබිය යුතු මුළු මුදල - රු. 1,20,140.00

අදාළ සියලු හිඟ වැටුප් සහ නඩු ගාස්තු ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් නමින් නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ තැන්පත් කරන ලෙස මෙයින් නියෝග කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**හිමාලි කුලරත්න,**
බේරුම්කරු.

2023 පෙබරවාරි මස 21 වැනි දින,

EOG 03-0154

මගේ අංකය: IR/COM/05/2018/225.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2312/05 දරන හා 2022.12.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධයට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් වාද්දුව, මොල්ලිගොඩ, හබරලගහලන්ද පාර, අංක 219/ඩී හි පදිංචි එච්.එස්.එල්. පෙරේරා මහතා සහ රත්මලාන, ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, අංක 100 හි පිහිටි බාටා ෂූ කම්පැනි ඔෆ් සිලෝන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 44/2022 දරන හා 2022.11.21 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් එච්.එස්.එල්. පෙරේරා මහතා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 44/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2023.12.27 දින සිට අවසන් වන බවට පනතේ 20(2) ආ වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 පෙබරවාරි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමු උපලේඛනය

( 3 වන නියෝගය) ''අ'' ආකෘති පත්‍රය

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

බේරුම්කරුවකුගේ තීරණය ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

එච්.එස්.එල්. පෙරේරා,
අංක 219/ඩී,
හබරලගහලන්ද පාර,
මොල්ලිගොඩ, වාද්දුව.
2023.01.28.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2022.12.27 දිනැති අංක 2312/05 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්ද වූ එච්.එස්.එල්. පෙරේරා සහ බාටා පාවහන් සමාගම බැඳී සිටින්නාවූ ද 2022.11.21 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2023 ජනවාරි මස 28 වැනි දින.
(පිටපත ; අනෙක් පාර්ශ්වය)

බාටා පාවහන් සමාගම අංක 100 ශ්‍රීමත් ජෝන් කොතලාවල පාර, රත්මලාන.

ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න)
දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක් සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුරද නිශ්චිතව සඳහන් කල යුතුය.

EOG 03-0155

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.